# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2318/11 - 2023 පෙබරවාරි මස 06 වැනි සඳුදා - 2023.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (v)

**1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත**

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ධීවර අමාත්‍ය.

2023 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2023 සමුද්‍රීය ජලජීවී වගා කළමනාකරණ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකා ජලතීරයේ අනුමත ප්‍රදේශයන්හි සමුද්‍රීය ජලජීවී වගාව, මෙම නියෝගයන්හි විධිවිධානයන්ට අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

3. කිසිදු සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක්, ස්වාභාවික රක්ෂිත ලෙස ප්‍රකාශිත යම් ස්ථානයන්හි හෝ ඓතිහාසික ස්ථානයන් හෝ රක්ෂිත ප්‍රදේශ ලෙස යම් නීතියක් මගින් ප්‍රකාශිත යම් ප්‍රදේශයක හෝ ධීවර හා සංචාරක නාවුක ප්‍රදේශයන්හි හෝ ඒ ආශ්‍රිතව හෝ පිහිටුවීම සිදු නොකළ යුතු ය.

4. අධිකාරිය විසින් නිකුත් කරන ලද ලිඛිත අවසරයකින් තොරව වගා කරනු ලබන ජීවීන්ගේ කිසිදු කොටසක් මුහුදට හෝ මුහුද අවට ස්වාභාවික පරිසරයට මුදා නොහැරිය යුතු ය.

5. වගා කිරීම සඳහා යොදාගනු ලබන ජලජීවී වගා ද්‍රව්‍ය සහ ක්‍රම එම කාර්යය සඳහා අධිකාරිය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනාව සමඟ අනුකූල විය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. යම් සමුද්‍රීය වරල් මත්ස්‍ය වගා කුඩු සහ ජලජීවී වගා කුඩු වගා ඒකකයක්, ඉසිලුම් ධාරිතාව, විශේෂය හා මෙහෙයුම් පරිමාව අනුව අධිකාරිය විසින් නිශ්චය කරන ලද පරිදි එක් එක් වගා ඒකකයක සිට අවම වශයෙන් කිලෝමීටර එකක් (01) ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.

7. සෑම සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක් ම, මධ්‍යම පරිසර අධිකාරිය හෝ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සකස් කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණ නියෝගවලට අනුකූල විය යුතු ය.

8. අධිකාරිය විසින් වගාබිම් තුළ භාවිත කරනු ලබන යම් ජෛව ප්‍රජාව හෝ ද්‍රව්‍යවල යම් හායනයක් සිදු වේ දැයි අධීක්ෂණය කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් වන අවම කිරීමේ පියවර ගනු ලැබිය යුතු ය.

9. කිසිදු තැනැත්තකු විසින්, ජලයේ ගුණාත්මකභාවය විනාශ කරනු ලබන හෝ පරිසරයට, මත්ස්‍යයන්ට හෝ මිනිස් සෞඛ්‍යයට හානිදායක වන යම් දූෂණකාරකයක් පරිසරයට මුදාහැරීම සිදු නොකළ යුතු ය.

10. අධිකාරිය විසින්, අනුමත රසායනික ද්‍රව්‍ය පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

11. කිසිදු තැනැත්තකු විසින්, අධිකාරිය විසින් අනුමත නොකරන ලද යම් රසායනික ද්‍රව්‍යයක් පරිසරයට මුදා හැරීම සිදු නොකළ යුතු ය.

12. අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ජලජීවී වගා කළමනාකරණ බලපත්‍රය ලැබීමෙන් පසු, යම් තැනැත්තකු විසින් එම බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට මාස හයක් ඇතුළත ජලජීවී වගා ව්‍යාපෘතියට අදාළ ප්‍රදේශය සංවර්ධනය කළ යුතු අතර, වාණිජ පරිමාණයෙන් නිෂ්පාදනය කිරීම ආරම්භ කළ යුතු ය.

13. යම් සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක් තුළින් හමුවන මියගිය මත්ස්‍යයන් හෝ වගා කරන ලද ජීවීන් අනුමත ප්‍රදේශ වෙත නිතිපතා බැහැර කිරීම සිදු කළ යුතු ය.

14. සමුද්‍රීය ජලජීවී වගා නිෂ්පාදන ප්‍රදේශවල විගණන කටයුතු, නියැදි ලබාගැනීම සහ එම ප්‍රදේශ පිළිබඳ විශ්ලේෂණ සිදු කිරීම සඳහා එම ප්‍රදේශ පාලනය කිරීමේ බලතල අධිකාරිය වෙත හිමිවිය යුතු ය.

15. සමුද්‍රීය මත්ස්‍ය ගොවිපළක යම් හිමිකරුවකු විසින්, වසංගත රෝග තත්ත්වයක් පිළිබඳ නිරීක්ෂණය වූ අවස්ථාවක හෝ එවැනි තත්ත්වයක් පිළිබඳ සැක කෙරෙන අවස්ථාවක, එම තත්ත්වය පිළිබඳ අධිකාරිය වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් එම තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය රෝග නිරෝධායන ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

16. සෑම සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක් විසින් ම, වගා කරනු ලැබ ඇති විශේෂ, භාවිතයේ ඇති වගාබිම්, ගොවිපළ සත්ත්ව පරිමාව, ලබාගන්නා ලද අස්වැන්න, විකුණුම් මාධ්‍ය (නිදසුන් : විකුණුම් සිදු කළේ දේශීය පරිභෝජනය සඳහා ද, අපනයන කටයුතු සඳහා ද යන්න), හඳුනාගත් රෝග මරණ ප්‍රමාණය, භාවිතා කරන ලද ආහාර (වර්ග) සහ සේවක සංඛ්‍යාව විස්තර කරමින් කාර්තුවකට (මාස තුනකට) වරක් තත්ත්ව වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

17. යම් සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක් විසින්, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) හෝ එම කාර්යය සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිර්දේශ කරනු ලැබූ වෙනත් යම් අධිකාරියක් විසින් හෝ සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් රෝග පරීක්ෂාවකට ලක් කරනු ලැබ, ආසාදිත නොවන බවට සහතික කරන ලද මත්ස්‍ය පැටවුන් හෝ මත්ස්‍ය බීජ පමණක් භාවිතා කළ යුතු ය.

18. සෑම සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක් විසින් ම, අධිකාරිය විසින් සකස් කරන ලද යහපත් කළමනාකරණ පරිචය (BMP) අනුගමනය කරනු ලැබිය යුතු ය.

19. සෑම සමුද්‍රීය ජලජීවී වගා ගොවිපළක් ම, ප්‍රදේශයේ යම් ජලජීවී වගා සංගමයක් හෝ ප්‍රදේශයේ ආයෝජකයන්ගේ සංගමයක් යටතේ ලියාපදිංචි කළ යුතු ය.

20. මෙම නියෝගවල -

"අධිකාරිය" යන්නෙන්, 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අදහස් වේ;

"මධ්‍යම පරිසර අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ;

"සමුද්‍රීය ජලජීවී වගාව" යන්නෙන්, මුහුදු ප්‍රදේශය තුළ, යම් වගා ක්‍රමවේදයන්ට අනුව යම් ජීවී විශේෂ වගා කිරීම අදහස් වේ;

"සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය" යන්නෙන්, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අදහස් වේ.

EOG 02 - 0044

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.